**2021 ජනවාරි මස 25 වන දින පැවති**

**තිස් තුන් වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2021.01.25**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **10.** | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **11.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **12.** | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **13.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **14.** | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| **15.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| **16.** | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **17.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **18.** | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **19.** | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **20.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **21.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා,ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් හා සුභ නව වසරක් ප්‍රාර්ථනය කරමින් ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලද අතර ලේකම්තුමා විශේෂ රාජකාරි කටයුත්තක් සඳහා සහභාගී වූ බැවින් මෙදින මහ සභාවට සහභාගී නොවන බැවින් ඒ සඳහා තාවකාලික ලේකම්වරිය ලෙස නයෝමි වීරකෝන් මහත්මිය නම් කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා තාවකාලික ලේකම් වරිය පත් කිරීමේ යෝජනාව ස්ථිර කරන ලද අතර, ඒ අනුව 2021.01.25 වන දින මහ සභාවේ තාවකාලික ලේකම්වරිය ලෙස නයෝමි වීරකෝන් මහත්මිය නම් කෙරිනි.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**2020.12.18 මහ සභා කෙටුම්පත් වාර්ථාව**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2020.12.18 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව හෝ සංශෝධන නොමැති නම් සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2020.12.18 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රි ඩී.පී බන්දුලසේන මැතිතුමා පෙ.ව 10.05 මහ සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා 2020.12.18 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්ථාව ,සංශෝධන වලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2020.12.18 වන දින පැවති මහ සභා කෙටුම්පත් වාර්ථාව සම්බන්ධයෙන් සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2020.12.18 මහ සභා වාර්ථාව සංශෝධන රහිතව සභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

**01. ගරු මන්ත්‍රි කේ. හැරිසෙන්ස් මැතිතුමා නව සභිකයෙකු ලෙස දිවුරුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රි බී.කේ අශෝක විමලසිරි මැතිතුමා වසර 22 ක් පමණ ගරු සභිකවරයෙකු ලෙස එතුමාගේ කාර්යභාර්ය නිවැරදිව සිදු කලා වුවත්, එතුමා මේ වන විට ඉල්ලා අස්වී වෙනත් තනතුරක් දැරීම නිසා ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් නව ගරු මන්ත්‍රිවරයෙකු ලෙස දිවුරුම් දී අද දින මහ සභාවට පැමිණ සිටින ගරු මන්ත්‍රි කේ හැරිසෙන්ස් මහතා ඉතාමත් ගෞරවයෙන් පිළිගනිමින් මෙහි කාර්යය භාර්යය ඉටු කිරීමේදී ගරු මන්ත්‍රිවරයෙකු ලෙස පවතින වගකීම තේරුම් ගනු ඇතැයි තමා අපේක්ෂා කරන බවත්, නැ.නු.ප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල බල ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවයන් තේරුම් ගෙන නිවැරදි අදහස් සහිතව පෙනී සිටින ලෙස ප්‍රකාශ කරමින් නව ගරු සභිකධූරය සම්බන්ධව මහ සභාවට නිවේදනය කරන ලදී.

**02. නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රි එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා,ගරු මන්ත්‍රි පී කරුණාරත්න මැතිතුමා, ගරු මන්ත්‍රි වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් ලිපි මහ සභාවට නිවේදනය කරන ලදී.

**03. ජාතික ගෞරවනාම සම්මාන සන්නස් පත්‍රය ගරු මන්ත්‍රි පී.ටී සිරිසේන මැතිතුමා වෙත පිරිනැමීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ජනනි ජන්ම භූමිශ්ච ස්වර්ගාදාපි ගරියෂි වැදූ මවත් උපන් බිමත් දෙව් ලොවටත් වඩා අගනේය, යන සුභාෂිතය සජීවත්වයට නංවාලමින් ස්වකීය මාතෘ දෘශ්‍ය ප්‍රෙව්ණිගත ජාති, දේශ සංරක්ෂණයෙහි අව්‍යාජයෙන් ව්‍යාවෘත පරාර්ථ චර්යා මුඛ්‍ය සාදු විහරණයෙන් යුතුව ස්වියආචායි වංශානුගත ආචාරධර්ම සංරක්ෂණය ස්ව දිවනාදර්ශණය කොටගත් ආත්මීයලාභී දිත්තාවර්ජිතව කෘත හූදී ජන

සංස්ථාව වෙනුවෙන් යුගමය වගකීම් අපමණ ඉටු කරමින් තම සංස්කෘතික දයාද සුරකිමින් ජාතීන් අතර සහයෝගීතාව පතුරවමින් කලා වූ සකලවිද සේවා සමුච්චය අගයනු වස් සමස්ථ ලංකා සංස්කෘතික සහයෝගීතා පදනමේ සංවත්සර මහ සභාවේදී, ගරු පී.ටී සිරිසේන මැතිතුමාට දේශමාන්‍ය ජාතික ගෞරවනාම සම්මාන සන්නස් පත්‍රය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ප්‍රභූ ආරාධිතයන් අතින් වර්ෂ 2020 දෙසැම්බර් මස 27 වන දින අනුරාධපුරදී පිරිනමනු ලැබූ බව ඉතා චිත්තප්‍රමෝදයෙන් යුතුව දන්වන බවට වූ සමස්ත ලංකා සංස්කෘතික සහයෝගීතා පදනම මගින් ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා වෙත ලබා දී තිබූ සහතික පත්‍රය මහ සභාවට නිවේදනය කරන ලදී.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**01. වරිපනම් අය කර ගම්මාන සංවර්ධනය කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා සිය කොට්ඨාශයේ කුඩා වැව ගමේ ඉදි කර ඇති රජයේ නිවාස සංකීර්ණයේ ඇතුලත මාර්ග හා කාණු පද්ධතිය මේ වන විට දැඩි අබලන් තත්වයේ පවතින බවත්, මෙහි ඇතැම් ඉදි කිරීම් සභා අනුමැතියකින් තොරව සිදු කරන බවත්, මෙම ගම්මානය රජය සතු වන බැවින් වරිපනම් අය කර ගනිමින් ගම්මානයේ බෝක්කු, පාරවල් සංවර්ධනය කිරීමට කටයුතු සලසා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා</u> අදාල ගම්මානය සංවර්ධනය කල යුතු තත්වයේ පවතින බැවින් වරිපනම් ගෙවීම සඳහා ගම්මානයේ පදිංචි පුද්ගලයන් කැමැත්ත ප්‍රකාශ කර ඇති බව සඳහන් කරන ලද අතර අදාල ප්‍රදේශයේ අළුත්වැඩියා කල යුතු හා අළුතින් ඉදි කල යුතු බෝක්කු කිහිපයක් පවතින බවද සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ජනතාවගේ කැමැත්ත තිබූ පමණින් වරිපනම් බදු අය කිරීමේ හැකියාවක් නොමැති බවත්, ඒ සඳහා දීර්ඝ වැඩ පිළිවෙළක් පවතින බවත් සඳහන් කරන ලද අතර අදාල නිවාස සංකීර්ණය ඉදි කිරීමේදී සභාව දැනුවත් කර නොමැති බවත්, ඒ සම්බන්ධයෙන් වන යටිතල පහසුකම් හැකි අයුරින් ඉටු කිරීමට පියවර ගන්නා බව ද සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ  මැතිතුමා</u> මහ නගර සභාව ආසන්නයේම පවතින ප්‍රාදේශීය සභාව වුවත්, අප මහ නගර සභාවට වඩා බොහෝ පසුපසින් සිටින බවත්, ප්‍රාදේශීය සභා භූමිය තුල ඉදි කරනු ලබන යම් ගොඩනැගිල්ලක් හෝ තාප්පයක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව දැනුවත්, වී අදාල අනුමැතිය ලබා දීමට කටයුතු කල යුතු බවත්, ඒ සඳහා නියමාණුකූල වූ වැඩ පිළිවෙළක් දියත් කරන ලෙසත් , ප්‍රකාශ කරන ලදී.

**02. අතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කර ගැනීම සම්බන්ධවයි.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ශ්‍රාවස්තිපුර, ශ්‍රාවස්තිවත්ත ලිපිනයේ පදිංචි ඩබ්.ඒ.එස් විජේසිංහ යන අය විසින් ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා මගින් ශ්‍රාවස්තිවත්ත, පොල්වත්ත ග්‍රාමයේ මාර්ගය පිළිසකර කිරීමේදී පවුල් 10 ක් පමණ ජීවත් වන බවටත්, ඔවුන් විසින් භාවිතයට ගැනෙන මීටර් 75 පමණ අතුරු මාර්ගය අතහැර පිළිසකර කිරීමට කටයුතු කර ඇති බවටත්, මෙම මීටර් 75 ක පමණ කොටසේ ජීවත් වන පවුල් වල දරුවන්ට හා වැඩිහිටියන්ට පා ගමණින් යාමට හෝ යතුරු පැදි වලින් යාමට නොහැකි වන පරිදී අබලන් වී ඇති බැවින් මෙම කොටස පිළිසකර කර දෙන ලෙසට කර ඇති ඉල්ලීම් ලිපිය මහ සභාවට ඉදිරිපත් කරන ලද අතර අදාල මාර්ගයට අවශ්‍ය බොරළු ලබා දීමට කටයුතු කරන බවට ප්‍රකාශ කරන ලදී.

**03. දුම්රිය හරස් මාර්ගය හා ප්‍රධාන මාර්ගය ආසන්නයේ පාර කොන්ක්‍රීට් කර පිළිසකර කර ගැනීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අනුරාධපුර කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ සිට අළුත්වැව දක්වා දිවෙන මාර්ගයේ දුම්රිය මාර්ගය හා කොන්ක්‍රිට් අතුරා ඇති මාර්ගය අතර මීටර් 15 ක පමණ කොටසක් අබලන්ව පවතින අතර කොන්ක්‍රීට් මාර්ගය අවසන් වන ස්ථානය එකවර අවසන් කර තිබීම හේතුවෙන් වාහනවලට දැඩි අලාභ හානි සිදු වෙමින් පවතී. එමෙන්ම යතුරුපැදි කරුවන් හා පාපැදිකරුවන් අනතුරට භාජනය වීම දිනෙන් දින ඉහල යමින් පවතින බවත්, මේ පිළිබඳ අවධානය යොමු කර දුම්රිය හරස් මාර්ගය ආසන්නයේ මීටර් 1.5 ක කොටස හා ප්‍රධාන මාර්ගයට ප්‍රවේශවන ස්ථානයේ මීටර් 20 ක කොටස සුදුසු පරිදී කොන්ක්‍රීට් අතුරා කඩිනමින් පිළිසකර කර දෙන ලෙස ගරු මන්ත්‍රි කුමුදු ප්‍රියන්ත මැතිතුමා මගින් කර ඇති ඉල්ලීම් ලිපිය මහ සභාවට ඉදිරිපත් කරන ලද අතර මෙම මාර්ගය සපිරි ගමක් ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීම සඳහා අවස්ථාව උදා වූවත්, එය සංවර්ධනය කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ අවසරය ලබා නොදුන් බැවින් ඒ ආසන්නයේ පැවති ඉතිරි කොටස සංවර්ධනය කල බවත්, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්වෙන් අවසර ඉල්ලා ඇති බැවින් ගරු මන්ත්‍රි කුමුදු ප්‍රියන්ත මැතිතුමා මැදිහත් වී අදාල අවසරය කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරන්නේ නම් එය ඉදි කිරීමේ හැකියාව පවතින බව සඳහන් කරන ලදී.

**04. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2021 පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ (පුනරාවර්ථන) වැඩසටහන**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021 වර්ෂය තුල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ (පුනරාවර්ථන) වැඩසටහන මගින් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බවට වූ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් යොමු කර තිබූ ලිපිය මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | ව්‍යාපෘති යෝජනාව | ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|
| 01 | පෙරටු කාර්යාලයේ ඉහළ මහල නවීකරණය කිරීම | රු 1,000,000.00 |
| 02 | ගබඩා ගොඩනැගිල්ලේ ඉහළ මහල නවීකරණය කිරීම | රු 500,000.00 |

**05. අඩු ආදායම් ලාභී පළාත් පාලන ආයතන වල ආදායම් ඉහල නැංවීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කිරීමේදී අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනවල වාර්ෂික ආදායම ඉහල නැංවීමේ අරමුණින් එම ආයතනය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් වාර්ෂික ස්වයං උත්පාදන ආදායම වර්ධනය කර ගත හැකි ආකාරයේ ව්‍යාපෘති හඳුනාගෙන ව්‍යාපෘති වාර්තා හා ඇස්තමේන්තු සකස් කර සහකාර කොමසාරිස්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලෙස යොමු කර තිබූ ලිපිය මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

**ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021.01.13 වන දින පැවති මුදල් කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**I. ප්‍රාදේශීය සභා පෙරටු කාර්යාලයේ තිරරෙදි සවි කිරීම**

ප්‍රාදේශීය සභා පෙරටු කාර්යාලයේ තිර රෙදි සවි කිරීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර_කැඳවන ලද මිල ගණන් අතරින් දිග13.7' පළල 9.7' ගොඩනැගිල්ලේ තිරරෙදි ස්ටෙප් අයිලට්, ලී බාර්, ලී රදවන සයිට් කැප් නූල් සමඟ මසා සවි කර දීමට අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති කුඩා නෙළුබැව, හිඳෝගම ලිපිනයේ පිහිටි සිහාන් ටෙක්ස් ඇන්ඩ් ටේලර්ස් වෙතින් සම්පූර්ණ වටිනාකම රු 41400.00 කට මිල දී ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**II. ප්‍රාදේශීය සභා පෙරටු කාර්යාලයට අවශ්‍ය වායු සමීකරණ යන්ත්‍ර මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභා පෙරටු කාර්යාලයට අවශ්‍ය වායු සමීකරණ යන්ත්‍රය මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන්, මාදිලි හා අනෙකුත් තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් මුදල් කමිටුවේ නිර්දේශයක් ලබා දිය නොහැකි බැවින් කැඳවන ලද මිල ගණන් තාක්ෂණික කමිටුවක් වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**III. ප්‍රාදේශීය සභා කාර්යාලයට අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභා කාර්යාලයට අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ඒ ඒ ආයතන වලින් අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**IV. කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය රෝලර් දොර සවි කිරීම.**

ප්‍රාදේශීය සභාවට අයත් කවරක්කුලම ආර්ථාක මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය රෝලර් දොර සපයා සවි කිරීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 253, බණ්ඩාරණායක මාවත, විජයපුර, අනුරාධපුර ලිපිනයේ පිහිටි රෝෂාන් අයන් වර්ක්ස් වෙතින් ආර්ථික මධ්‍යස්ථානයට අවශ්‍ය රෝලර් ෂැටර් දොර මිල දී ගෙන සවි කිරීම සම්පූර්ණ වටිනාකම රු 171,200.00 යටතේ සිදු කිරීම සුදුසු බවට මුදල කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා 2021.01.13 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථීර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021.01.13 වන දින මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරිම සම්බන්ධව යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021 ජනවාරි මස මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

**02. 2021 පෙබරවාරි මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021 පෙබරවාරි මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**2021 පෙබරවාරි**

| | | පැය ගණන |
|---|---|---|
| 01. ටී.එන් අමරතුංග මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. එච්.එම්.එස්.ඩී චන්ද්‍රසිරි මිය | (කළ.සේවා නිළධාරී) | 50 |
| 03. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |
| 04. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 50 |
| 05. එස්.පී.එම් පුෂ්පකුමාරී මිය | (පුස්තකාල සහයක) | 40 |
| 06. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහයක) | 40 |
| 07. ඩබ් තිලකරත්න මයා | (කා.කා.ස) | 40 |
| 08. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 09. ඒ.ඒ පියතිස්ස මයා | (මුරකරු) | 75 |
| 10. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 75 |
| 11. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 12. එච්.ඩබ් නිශාන්ත සුනිල් මයා | (නල ලිං කාර්මික) | 40 |
| 13. ජේ.එම්.ජේ.ආර්.කේ ජයසුන්දර | (විදුලි කාර්මික) | 40 |
| 14. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 15. ඩී.එම් ගුණරත්න බංඩා මයා | (කා.කා සහයක) | 75 |
| 16. සුභාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 40 |
| 17. චරිත් උදයකාන්ත මයා | (අනියම් රියදුරු) | 40 |
| 18. පියල් බුද්ධික මයා | (අනියම් මාර්ග කම්කරු) | 40 |
| 19. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 40 |

ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා 2021 පෙබරවාරි මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සම්බන්ධව යම් විරෝධතාවයන් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2021 පෙබරවාරි මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා 2021 වර්ෂය වෙනුවෙන් සකස් කර ඉදිරිපත් කර ඇති අයවැය වාර්ථාව තුල විශාල වැරදි ප්‍රමාණයක් දක්නට ලැබෙන බවත්, මෙ සම්බන්ධව දැඩි අවධානය යොමු කල යුතු බවත්, පන්සල් පිළිබඳව, වැව් පිළිබඳව, ඇතුළු විශාල ප්‍රමාණයක වැරදි ප්‍රමාණයක් පවතින බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මෙය ජාතික ලේඛනාගාරයට යන ලියවිල්ලක් වන බැවින් මේ සම්බන්ධයෙන් දැඩි අවධානය ලක් කර නිවැරදි කිරීමක් සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

**03. අත්තිකාරම් ගිණුම වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් විවෘත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2020.07.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ප්‍රාදේශීය සභා නිළධාරීන් හා සේවකයින් සඳහා ගෙවිය යුතු සේවක ණය සඳහා වෙනම අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යා යුතු බවට සඳහන් වන බැවින් වෙනම අත්තිකාරම් ගිණුමක් සඳහා බැංකු ගිණුමක් විවෘත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා අදාල කාර්යය සිදු කිරීමේදී ඇති වන ගැටළුවලට විසඳුමක් ලෙස හා නෛතිකව සිදු කල යුතු කාර්යයක් වන බැවින් ප්‍රාදේශීය සභාවේ නිළධාරීන් හා සේවකයින් සඳහා ගෙවිය යුතු සෙවක ණය සඳහා වෙනම අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යාමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් වෙනම අත්තිකාරම් ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04. ප්‍රාදේශීය සභාව මගින් මෙතෙක් බදු දී ඇති පාසල් භූමි තුල පිහිටුවා ඇති දියර කිරිහල් අදාල පාසල් වෙත පවරා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා පළාත් සභාව මගින් මෙම ප්‍රාදේශීය සභාව වෙත ලබා දී තිබූ මෙම ප්‍රාදේශීය සභාව මගින් මෙතෙක් කලක් මාසික බදු පදනම යටතේ පවත්වාගෙන යන ජනාධිපති විදුහල් පාසල් භූමියේ පිහිටුවා ඇති දියර කිරිහල් හා රත්මලේ තිස්ස මහ විද්‍යාල පාසල් භූමියේ පිහිටුවා ඇති දියර කිරිහල මේ වන විට වාර්ෂිකව රු 3000 ක බදු මුදලක් ප්‍රාදේශීය සභාවට ගෙවන නමුත් අදාල පාසලේ විදුහල්පතිවරයා විසින් දෛනිකව රු 100.00 ක මුදලක් පාසල වෙත අය කිරීම සිදු කරන බවට වාර්ථා වී ඇති හෙයින් මෙම දියර කිරිහල් දැනට පවත්වාගෙන යනු ලබන වෙළඳුන් දැඩි අපහසුතාවයට පත්ව ඇති බවත්, කොවිඩ් වසංගතය හේතුවෙන් පාසල් වසා තැබීම නිසා බදු අය කිරීමේදී දුෂ්කර වී ඇත.එබැවින් අදාල දියර කිරිහල් පාසල් වෙතම පවරා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ලැබිය යුතු ආදායමක් එලෙස අත්හැරීම සුදුසු නොවන බවත්, පවතින අයහපත් සෞඛ්‍ය තත්වය යතා තත්වයට පත් වන තුරු ඔවුන්ගේ ආදායම අහිමි වී ඇති බැවින් එතෙක් එම මුදල් අය කර නොගෙන තත්වය යතා තත්වයට පත් වූ පසු විදුහල්පතිතුමා සමඟද සාකච්ඡා කර වෙළඳුන්ට අසාධාරණයක් නොවන පරිදි ගාස්තු අය කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව සංශෝධන සහිතව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස් බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අයහපත් සෞඛ්‍ය තත්වය යතා තත්වයට පත් වන තුරු අදාල බදු මුදල් අය කර නොගෙන තත්වය යතා තත්වයට පත් වූ පසු විදුහල්පතිතුමා සමඟද සාකච්ඡා කර වෙළඳුන්ට අසාධාරණයක් නොවන පරිදි ගාස්තු අය කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** **මල්බෙරිවත්ත එක්සත් සමඟි සමිති ශාලාවේ වහලය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මල්බෙරි වත්ත එක්සත් සමඟි සමිතිය සඳහා ඉදි කරනු ලබන නව සමිති ශාලාවේ වහලය සඳහා සමිතියේ ගිණුමේ පවතින මුදල් ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බව ප්‍රකාශ කරමින් ඒ සඳහා 12'' x 4.3'' ඇස්බැස්ටෝස් ෂීට් 20 ක් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා අදාල ගොඩනැගිල්ල සඳහා ශීට් 20 ක් නොව 30 ක් ලබා දීමට කටයුතු කරන ලෙසත්, ගරු සභාපතිතුමාගේ කොට්ඨාශයට අයත් කීරික්කුලම කොම්පෝස්ට් අංගනයට යන මාර්ගයේ පිහිටා ඇති ක්‍රිඩා පිටියේ ප්‍රජා ශාලාවේ වහලය මේ වන විට හානියට ලක් වී ඇති බැවින් එය පිළිසකර කිරීමට කටයුතු කරන ලෙසද සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් චාමර මැතිතුමා ප්‍රාදේශීය සභාවක් ලෙස ඉටු කල හැකි කාර්යය බොහොමයක් පවතින බැවින් මල්බෙරිවත්ත එක්සක් සමඟි සමිති ශාලාවේ වහලය සඳහා ඇස්බැස්ටෝස් ශීට් 12'' x 4.3'' ප්‍රමාණයෙන් 20 ක් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් මල්බෙරිවත්ත එක්සක් සමඟි සමිති ශාලාවේ වහලය සඳහා ඇස්බැස්ටෝස් ශීට් 12'' x 4.3'' ප්‍රමාණයෙන් 20 ක් ලබා දීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**06.** **වෘත්තීය පුහුණුව සඳහා පුහුණු ලාභීන් දෙදෙනෙකු බඳවා ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අනුරාධපුර කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථානය මගින් 2018 වර්ෂයේ MS Office සහ Graphic පාඨමාලාවන් සම්පූර්ණ කර ඇති අංක 69, උණගස්වැව, අනුරාධපුර ලිපිනයේ පදිංචි චමෝද් චන්දිමාල් ඕපාත යන අය හා පෙර පාසල් හා ප්‍රාථමික ගුරු පුහුණු මධ්‍යස්ථානයේ පෙර පාසල් උපදේශිකා පාඨමාලාව හදාරා ඇති සේනානායක මාවත, වන්නියම්කුලම, අනුරාධපුර ලිපියේ පදිංචි ආර්.එම් අමාලි සෙව්වන්දි රත්නායක යන අය වෘත්තීය පුහුණුව ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති බැවින් මාස 06 ක පුහුණුවක් දෛනිකව රු 500 දීමනාව යටතේ බඳවා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා අදාල ඉල්ලුම්කරුවන් වෘත්තීය පුහුණුව සඳහා මාස 06 කට දෛනිකව රු 500 ක දීමනාව යටතේ බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනා ව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අනුරාධපුර කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථානය මගින් 2018 වර්ෂයේ MS Office සහ Graphic පාඨමාලාවන් සම්පූර්ණ කර ඇති අංක 69, උණගස්වැව, අනුරාධපුර ලිපිනයේ පදිංචි චමෝද් චන්දිමාල් ඕපාත යන අය හා පෙර පාසල් හා ප්‍රාථමික ගුරු පුහුණු මධ්‍යස්ථානයේ පෙර පාසල් උපදේශිකා පාඨමාලාව හදාරා ඇති සේනානායක මාවත, වන්නියම්කුලම, අනුරාධපුර ලිපියේ පදිංචි ආර්.එම් අමාලි සෙව්වන්දි රත්නායක යන අය වෘත්තීය පුහුණුව සඳහා මාස 06 ක් දෛනිකව රු 500 දීමනාව යටතේ බඳවා ගැනීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**07.** **කොන්ත්‍රාත් පදනම මත කසළ කළමණාකරනය වෙනුවෙන් බඳවා ගනු ලැබූ සේවකයින්ගේ කොන්ත්‍රාත් සේවා කාලය දීර්ඝ කිරීම**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මෙම ප්‍රාදේශීය සභාවේ කසළ කළමණාකරණ කටයුතු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති ඩී. අසේල මීරියගල්ල සහ දිලුන් චින්තක කරුණාරත්න යන අයගේ සේවා කාලය තවත් මාස 06 කින් දීර්ඝ කර ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා</u> අදාල සේවකයින් දෙදෙනාගේ සේවා කාලය මාස 06 කින් දීර්ඝ කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් කසළ කළමණාකරණ කටයුතු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති ඩී. අසේල මීරියගල්ල සහ දිලුන් චින්තක කරුණාරත්න යන අයගේ සේවා කාලය තවත් මාස 06 කින් දීර්ඝ කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** **ආතර් ද සිල්වා ක්‍රීඩා පිටිය අසලින් නිවෙස් වලට යන ගමන් මාර්ගය වෙන් කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> කුරුණෑගල පාර, ශ්‍රාවස්තිවත්ත, ශ්‍රාවස්තිපුර ලිපිනයේ පදිංචි අයි.එම් ධම්මසේන යන අය විසින් 06 දෙනෙකුගේ අත්සන සහිතව අංක 260 ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ පිහිටී ආතර්ද සිල්වා ක්‍රීඩාංගනය අසලින් ඇති නිවස් වලට යන මාර්ගය කිසිදු බාධාවකින් තොරව වසර 35 ට අධික කාලයක් භාවිතා කලත්, දැනට වසර 1 ½ ක පමණ කාලයක සිට ක්‍රීඩා සාමාජය යැයි කියා ගන්නා ලද කිහිපදෙනෙකු විසින් වසා දැමීමට කටයුතු කරමින් සිටින බවත්, දැනට මෙම මාර්ගය හැර නිවාස වලට යාම සඳහා මෙන්ම ක්‍රීඩාගාරයට යාම සඳහා විකල්ප මාර්ගයක්ද නොමැති බැවින් මෙම මාර්ගය නිවාස වලට යාමට සහ ක්‍රීඩාගාරයට යාම සඳහා පොදු මාර්ගයක් ලෙස ලබා දෙන ලෙසට කර ඇති ඉල්ලීම් ලිපියත්, නාවිවාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාර්ගය භාවිතා කරනු ලබන ප්‍රදේශයේ මහජනතාවගේ දැඩි අවශ්‍යතාවය මතු කොට මාර්ගයේ පළල, ප්‍රධාන මාර්ගයේ සිට ඇති දුර ආදිය සඳහන් කොට ප්‍රාදේශීය සභාවේ සභා සම්මත යෝජනාවක් මගින් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මාර්ගය වෙන්කර දිය හැකි බවට දන්වා ඇති ලිපියත්, අදාල ක්‍රීඩා පිටියට අයත්, ක්‍රීඩා සමාජය විසින් ක්‍රීඩා පිටිය නිසි පරිදී හඳුනා ගෙන ක්‍රීඩා පිටිය වටා වැටක් ඉදි කර දෙන ලෙසට කර ඇති ඉල්ලීමේ ලිපිය මහ සභාවට ඉදිරිපත් කරමින් මේ සඳහා කුමන ක්‍රියාමාර්ගයක් ගත යුතුද යන්න සභා සම්මුතියක් ලබා ගත යුතු බවට ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා</u> මෙහි ක්‍රීඩා භූමියට යාබදව පවතින ඉඩමේ පවුල් 03 ක් ජීවත් වූ බවත්, පසුව ඉදිරිපස කොටස පුද්ගලයෙකුට විකුණූ බවත්, අදාල විකිණීමේදී පසුපස ඉඩම් වලට යාමට මාර්ගය ලබා දිය යුතු වුවත්, එය එසේ සිදු කර නොමැති බවත්, වසර 35 ක් මෙහි මාර්ගයක් නොතිබූ බවත්,මිල දී ගනු ලැබූ පුද්ගලයාගේ මුදල් බලය, දේශපාලන බලය යොදවා ගෙන මෙම ගැටළුව යට ගසන බවත්, අදාල මාර්ගය පවුල් 02 ක් පමණක් භාවිතා කරන බවත්, ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් සංවර්ධන ආඥා පනතට අනුව අවශ්‍ය පියවර ගත යුතු බවත්, ඒ සඳහා ලිපියක් යොමු කිරීම පමණක් ප්‍රාදේශිය සභාව මැදිහත් වී සිදු කල යුතු බවත්, ක්‍රීඩා පිටිය තුලින් මාර්ගයක් ලබා දීමට සභාවක් ලෙසට සූදානම් නොවන ලෙසත්, එය ඉදිරියේදී නරක පූර්වාදර්ශයක් වන බවත්, එම ඉඩම තුල පොදු ළිඳක්ද පවතින මුත් එයද ඔවුන් අයිතියට රැගෙන ළිඳ වසා තිබෙන බවත්, අදාල මාර්ගය පසුපස නිවාස සඳහා ගමන් කල පිරිස භාවිතයට ගැනීමට ප්‍රථම ඉදිරිපස ඉඩමෙන් ගමන් ගත් නමුත් අදාල ඉඩම් හිමියා එලෙස යාම සිදු නොකරන ලෙස ප්‍රකාශ කල අවස්ථාවේ සිට ඔවුන් පිට්ටනිය කෙලවරින් ගමන් ගත් බවත්, දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද පොදු ඉඩම් පෞද්ගලීකරණය කිරීමකට ඉඩ නොතැබිය යුතු බවත්, නීත්‍යානුකූල මාර්ගයක් ඇතුලත් කල යුතු නැති බවත්, ඉඩම් නීතියට අනුව කටයුතු කර දෙන ලෙසට ප්‍රාදේශීය ලේකම් වෙත භාර නොදෙන්නේ මන්ද යන්නත්, අදාල මාර්ගය ඉදිරි ඉඩම් හිමියාගේ කොටසින් ලබා දීමට කටයුතු නොකරන්නේ මන්ද යන්න විමසන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> මෙවැනි ගැටළුවකදී අප සංවේදී විය යුතු බව ප්‍රකාශ කරමින් ප්‍රදේශයේ වැඩිම වටිනාකමක් සහිත ක්‍රීඩා පිටිය මෙම ක්‍රීඩා පිටිය වන බවත්, අදාල ඉඩම විකිණීමේදී මාර්ගයක් සහිතව විකුණා නොමැති බවත්, ඉඩම මිල දී ගත් පුද්ගලයා ඉඩම මිල දී ගත් පසුව තාප්පයකින් වෙන් කර ගත් පසු පසුපස ඉඩම් වල පුද්ගලයින් පිට්ටනිය කෙළවරින් ගමන් ගත් බවත්, අදාල මාර්ගය මේ වන විට පිට්ටනියට අත්‍යාවශ්‍ය වී පවතින බවත්, ක්‍රීඩාගාරය මේ වන විට ඉදි කර ඇත්තේ බස්නාහිර කෙළවරින් වන බවත්, අදාල ක්‍රීඩාගාරය වෙත ගමන් කිරීම සඳහා අනිවාර්යෙන්ම ක්‍රීඩා පිටියේ වම්පසින් මාර්ගයක් තිබිය යුතුමයි යන්නත්, එම මාර්ගයේ අදාල ඉඩම් හිමියන් ගමන් කලාට ප්‍රාදේශීය සභාවේ විරුද්ධත්වයක් ප්‍රකාශ කල යුතු නැති බව තම මතය බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> ක්‍රීඩා සමාජයේ සමාජිකයින් විදුලි රැහැන් යෙදූ කණු ඉවත් කර ක්‍රීඩා පිටියෙන් වෙනම කොටසක් මාර්ගය ලෙස වෙන් නොකර අදාල පුද්ගලයින්ට භාවිතයට ගැනීම සඳහා අවස්ථාව ලබා දීමටත්, ක්‍රීඩා පිටිය වැඩි දියුණු කර දෙන ලෙසටත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාසිංහ මැතිතුමා</u> මෙම ගැටළුව පුද්ගල කේන්ද්‍රීය ගැටළුවක් නොව සමාජ කේන්ද්‍රිය ගැටළුවක් බවත්, ප්‍රාදේශීය සභාවක් ලෙස අප සිටිය යුතු සමාජ කේන්ද්‍රිය ගැටළුවක් ලෙස තීන්දු තීරණ ගැනීම සඳහා බවත්, එය උපනුපන් පරම්පරාව වෙනුවෙන් ගත යුතු තීරණයක් බවත්, අදාල ඉඩම් සින්නක්කර ඉඩම් ලෙස තිබෙන බවත්, පාදෙණිය නගරයේ සිට අනුරාධපුර දිස්ත්‍රික්කයට පැමිණෙන තුරු මෙවැනි වටිනාකමකින් යුතු එකදු පොදු ක්‍රීඩා පිටියක් නොමැති බවත්, පවතින විසඳුම වන්නේ ගරු කුමුදු ප්‍රියන්ත මැතිතුමා සඳහන් කල පරිදී ඉඩම් සංවර්ධන ආඥා පනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් විසින් ගත යුතු ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කරන ලෙස සඳහන් කරමින් ඉන් පසුව අදාල සංවර්ධන කටයුතු සිදු කරන ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර ගරු සභාපතිතුමා විසින් ගනු ලබන තීන්දුව ඓතිහාසික තීන්දුවක් වන බවත්, දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.හැරිසෙන්ස් මැතිතුමා</u> ගරු සභාපතිතුමාට සුභ උපන් දිනයක් ලෙසත්, ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා ටත් සුභ පතමින් තමන් මූලික අධ්‍යාපනය පාලාඩිකුලම විද්‍යාලයේත්, වැඩි දුර අධ්‍යාපනය දීපානි විද්‍යාලයේදී ත් හදාරා මෙතෙනට ආ ගමන් මගේ දීර්ඝ කාලයක් පුරා දැඩි වෙහෙසක් දැරූ බවත්, , අතීතයේදී තමන් සිටියේ ජල විදුලිය ආදී පහසුකම් රහිත, දීර්ඝ කාලයක් පුරා ගැටළු ගණනාවකින් පිඩා විදින ජනතාවක් සමඟ බවත්, මෙම ගැටළු වලට මුහුණ දෙමින් සිටියදී තමන් සමඟ සිටගත් දේශපාලන පක්ෂයක් ලෙස තමන් ජනතා විමුක්ති පෙරමුණ තෝරා ගත් බවත්, එතැන් සිට ආ ගමන් මගේ තමා අද සිටින තැන ගැන සතුටු වන බවත්, දුක් විදින මිනිසුන්ගේ දේශපාලන ව්‍යාපාරයක තනතුරක් තමන් වෙත ලැබී තිබෙන බවත්, ගරු සභාපතිතුමා සඳහන් කල පරිදී නැ.නු.ප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවිතය ඉදිරියට ගෙන යන වගකීම් වලදී ප්‍රාදේශීය සභාවක් ලෙස දිය යුතු උපරිම දායකත්වය තමන් ගරු මන්ත්‍රිවරයෙකු ලෙස ලබා දෙන බවත් සඳහන් කරමින් ගරු මන්ත්‍රී බී.කේ අශෝක විමලසිරි මැතිතුමා වෙත සභා බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කල සේවයට ප්‍රාදේශීය සභාවේ ගෞරවය පුද කරන බවත්, වගා කිරීම සඳහා ජලය නොමැති තත්වයත් මත එහි ඇල වේලි ටික කපන්න, සිදී ගිය වැව් නැවත ජලයෙන් පුරවාලීමට ගරු අශෝක මැතිතුමා ගත් උත්සහය අති මහත්, බවත්, මෙය එතුමා කල කාර්යයන් තුල ඉතා අල්ප ප්‍රමාණයක් බවත්, එවැනි කාර්යයන් බොහෝමයක් එතුමා විසින් ඉටු කල බවත්, ඒ සම්බන්ධයෙන් තම ස්තූතිය ගෞරවයෙන් පුද කරන බවත්, සඳහන් කරන ලදී.

තවද ක්‍රීඩා පිටියක් යනු ප්‍රදේශයේ තරුණ තරුණියකන්ගේ ක්‍රිඩා හැකියාව නංවාලීම වෙනුවෙන් පවතින ස්ථානයක් බැවින් හා ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලය පත් කල මහජනතාව විසින් එම පත් කිරිම සිදු කර ඇත්තේ පොදු මහජනතාව වෙනුවෙන් සේවය කිරීම සඳහා මිස එක් පුද්ගලයෙකු ගේ සුභ සිද්දිය සඳහා පමණක් නොවන බැවින් ආතර් ද සිල්වා ක්‍රීඩා පිටියට අයත් භූමි ප්‍රමාණය සඳහා ඒ අයිතිය ලබා දිය යු.තු බවත්, ගරු මන්ත්‍රීවරයෙකු ලෙස පොදු අයිතීන් වෙනුවෙන් නැගී සිටින බවත්, එකදු පුද්ගලයෙකුට හෝ පොදු දේපල තමන්ගේ හිතු මනාපයට තනි භාවිතයට ගැනීම සඳහා ඉඩ දිය නොහැකි බව දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද ප්‍රාදේශීය සභාවක් ලෙස ඉදිරිපත් කරනු ලබන ඕනෑම හොඳ යෝජනාවක් සඳහා තමන්ගේ සහයෝගය ලබා දෙන බවත්, එසේ නොවන ඕනෑම අවස්ථාවක ඒ වෙනුවෙන් පෙනී සිටින බවත්. ප්‍රකාශ කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u> සභාවක් ලෙස අප ක්‍රීඩා පිටිය සම්බන්ධයෙන් නිවැරදි තීරණයකට එළඹිය යුතු බවත්, වර්ථමානය වන විට, කුඹුරු ගොඩ කිරීම සඳහා, කුණු ඇල ගොඩ කිරීම සඳහා , පරිසර බලපත්‍රයක් ලබා ගැනීම සඳහා කිසිසේත් හැකියාවක් නොමැති තත්වයක් තිබියදී පරිසර බලපත්‍රයක් ලබා ගැනීම, පොදු ළිඳ සිය අයිතියට ලබා ගැනීම ආදී ක්‍රියාමාර්ග අදාල ඉදිරිපස ඉඩමේ අයිතිකරු විසින් සිදු කර තිබියදී, මෙලෙස ක්‍රිඩා පිටියට එවැනි තත්වයක් ඇතිකර දීමට කිසිසේත්ම ඉඩ දිය යුතු නැති බවත්, මෙම ගැටළුව සඳහා ප්‍රාදේශීය සභාව මැදිහත් නොවී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා පිටියට අයිති කොටස මිනුම් කර නිවැරදිව පවරා ගැනීමටත්, අදාල මාර්ගය ඉඩම් ආඥා පනත යටතේ පවතින බලය අනුව වෙන් කිරීම ප්‍රාදේශීය ලේකම්වරයාගේ කාර්යය භාර්යයක් වන බැවින් ඒ සඳහා ඉල්ලීම් කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> පවතින තත්වය මත සිදු කල යුතු එකම ක්‍රියාමාර්ගය වන්නේ ක්‍රීඩා පිටියෙන් වෙනම මාර්ගය වෙන් නොකර ක්‍රීඩා පිටියේ ක්‍රීඩා කිරීමට හැකි වන පරිදීත්, මාර්ගයේ ගමන් කල හැකි වන පරිදීත්, සකස් කර දීම බවට ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මේ වන විට මාර්ගයක් භාවිතා කල බවට සලකුණු තිබෙන බවත්,වසර 35 ක් මෙම මාර්ගය භාවිතා කල බවට සඳහන් කර තිබෙන බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් චාමර මැතිතුමා මේ සම්බන්ධව ප්‍රශ්ණකාරී තත්වයක් මතු වී ඇති හෙයින් ඒ සඳහා

කමිටු සභාපති - ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා
කමිටු සාමාජික - ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා
කමිටු සමාජික - ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා
කමිටු සාමාජික - එස්.ඒ.කේ.බී ගුණවර්ධන මැතිතුමා
ලේකම් - යූ.ඒ ධම්මික මයා
තාක්ෂණ නිළධාරී - ආර්.එම්.සී.ජේ.කේ රාජපක්ෂ මයා යන අයගෙන් සමන්විත කමිටුවක් පත් කළ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීම සුදුසු බවටත්, අදාල කමිටු නිර්දේශය එළබෙන මහ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවටත්, යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය</u> එම යෝජනාව ස්ථිර කරන ලද අතර ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඒ සම්බන්ධව විරෝධතා පවතින්නේද යන්න විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් කමිටු නිර්දේශය මහ සභාවට ඉදිරිපත් කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී ගයාන් චාමර මැතිතුමා ප.ව 11.50 ට මහ සභාවෙන් පිටව යන ලදී.

**09. ශ්‍රාවස්තිපුර වැව් මාළු ලැල්ල ඉල්ලීම් කල පුද්ගලයෙකු වෙත බදු පදනමින් ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මොරගොඩ පදිංචි ඩී.සී.පී දිසානායක යන අය විසින් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව ටෙන්ඩර් ක්‍රමය යටතේ ලබා දෙන ශ්‍රාවස්තිපුර මීරිදිය මාළු ලැල්ල මෙම වර්ෂය සඳහා ටෙන්ඩර් කැඳවීමේදී සිය නොදැනුවත්කම මත ටෙන්ඩර් ඉදිරිපත් කල නොහැකි වූ බැවින් එම මාළු ලැල්ල මඟ හැරී ගිය අතර කිසිදු පුද්ගලයෙක් මෙතෙක් එම ස්ථානය ඉල්ලීම් කර නොමැති හෙයින් පවතින තක්සේරු මුදල යටතේ මාළු ලැල්ල තමන් වෙත ලබා දෙන ලෙසට කර ඇති ඉල්ලීම් ලිපිය මහ සභාවට ඉදිරිපත් කරමින් වාර්ෂික තක්සේරු මුදල යටතේ අදාල පුද්ගලයා වෙත ශ්‍රාවස්තිපුර වැව් මාළු ලැල්ල බදු පදනමින් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා අදාල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ශ්‍රාවස්තිපුර වැව් මාළු ලැල්ල මොරගොඩ පදිංචි ඩී.සී.පී දිසානායක යන වෙත තක්සේරු මුදල යටතේ 2021 වර්ෂය වෙනුවෙන් ලබා දීම සුදුසු බවට වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10. පුස්තකාල විද්‍යාව පිළිබඳ සහතිකපත් පාඨමාලාව සඳහා පුස්තකාල සහයක වරියක යොමු කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් කොහා මෘදුකාංගය භාවිතය පිළිබඳව න්‍යායික හා ප්‍රායෝගිකව විධිමත් පුහුණුවක් ලබා දීමේ අරමුණින් සහතිකපත්‍ර පාඨමාලාවක් සැළසුම් කර ඇති බැවින් මාස 03 ක පාඨමාලා කාලසීමාවක් සහිත, සිංහල මාධ්‍යයෙන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනීය ශ්‍රවණාගාරයේදී 2021 මාර්තු මස සිට රු 30,000 ක මුදලකට පැවැත්වෙන පාඨමාලාව සඳහා නෙළුබැව පුස්තකාලයේ පුස්තකාලයාධිපති ලෙස සේවය කරන ගීතිකා ගමගේ මහත්මිය යොමු කිරීම සුදුසු බවටත්, ඒ සඳහා වන පාඨමාලා ගාස්තුව ප්‍රාදේශීය සභාව මගින් දැරීම සුදුසු බවටත් යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා පුස්තකාල විද්‍යාව පිළිබඳ සහතිකපත් පාඨමාලාව සඳහා පුස්තකාල සහයක වරියක වන ගීතිකා ගමගේ මහත්මිය සහභාගී කරවීම සුදුසු බවට වූ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් පුස්තකාල විද්‍යාව පිළිබඳ සහතිකපත් පාඨමාලාව සඳහා පුස්තකාල සහයක වරියක වන ගීතිකා ගමගේ මහත්මිය සහභාගී කරවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මධ්‍යහන 12.00 සභා ගර්භයෙන් පිටව යන ලදී.

**11.** **ටෙන්ඩර් මගින් ලබා නොගත් මාළු ලැලි වෙළඳ කුටි ලෙස පිළිසකර කර භාවිතා කිරීම සඳහා ඉල්ලීම් කරන පුද්ගලයින් වෙත වෙළඳකුටි ලබා දී ඇති ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් ලබා දීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ටෙන්ඩර් මගින් ලබා නොගත් මාළු ලැලි වෙළඳ කුටි ලෙස පිළිසකර කර භාවිතා කිරීම සඳහා ඉල්ලීම් කරන පුද්ගලයින් වෙත වෙළඳකුටි ලබා දී ඇති ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් වාර්ෂිකව රු 3000 ක මුදලකට ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> මෙම යෝජනාව ඉතාමත් සාර්ථක හා වඩාත් සුදුසු කාර්යයක් වන බැවින් අදාල පුද්ගලයන්ගේ අවශ්‍යතාවය අනුව සකස් කර කිසි ලෙසකින්වත් මාළු ලැලි ලෙස භාවිතා නොකර වෙළඳ කුටි ලෙස භාවිතා කල යුතු බව ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමා විසින් කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් විරෝධතා පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ටෙන්ඩර් මගින් ලබා නොගත් මාළු ලැලි වෙළඳ කුටි ලෙස පිළිසකර කර භාවිතා කිරීම සඳහා ඉල්ලීම් කරන පුද්ගලයින් වෙත වෙළඳකුටි ලබා දී ඇති ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් වාර්ෂිකව රු 3000 ක මුදලකට ලබා දීම සුදුසු බවට වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** **වන අලි තර්ජනය වෙනුවෙන් පිළියම් යෙදීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා වන අලි තර්ජනය වෙනුවෙන් යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කරමින් අදාල යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා යෝජක වන ගරු උප සභාපතිතුමාට ආරාධනා කරන ලදී.

<u>ගරු උප සභාපති එම්. සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> මොරගොඩ, සින්නික්කුලම, අළුත්වැව, හේනපොලයාගම, කුඩාවැව යන ගම්මාන වලට මීට වසර ගණනාවක සිට වන අලි ගම්වැදීම නිසා වගාවන්ට මෙන්ම මිනිස් ජීවිත වලට ද විශාල වශයෙන් හානී සිදු වී ඇති බවටත්, විදුලි ආරක්ෂිත වැට තිබුනද එය බිඳ දමමින් වන අලි ගම් වදින බවටත්, තිරසාර විසඳුමක් වශයෙන් අවශ්‍ය පමණ අඟල් කපා අලි වැට නිසි පරිදි සංවර්ධනය කර හෝ එසේත් නොමැති නම් දෛනිකව මුර සංචාරය සඳහා ආරක්ෂාව සපයන්නේ නම් වගාවන්ට මෙන්ම මිනිස් ජීවත වලට වන හානිය වලක්වා මෙයින් ආරක්ෂා වනු ඇති බවත්, ප්‍රකාශ කරමින් විදුලි වැට නවීකරණය කර අඟල් ඉදි කර දීම සඳහා වූ යෝජනාවක් සභා සම්මත කර ගනිමින් ගරු විෂය භාර අමාත්‍ය වරයා වෙතත්, දිස්ත්‍රික් ලේකම් වරයා වෙතත්, යොමු කර ජනතාවට හා වගාවන්ට වන හානිය වලක්වා ගැනීම සඳහා වගකිව යුතු මහජන නියෝජිතයන් ලෙස පෙනී සිටීම සුදුසු බවට යෝජනා කරන ලදී.

තවද උද්සෝෂණ, වගා හානී , ජීවිත හානි මින් ඉදිරියට සිදු නොවී, තල්වැට සකස් කිරීම සඳහා කටයුතු කිරීම සුදුසු බවටත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.හැරිසෙන්ස් මැතිතුමා</u> විදුලි වැට ඉදි කිරීමෙදී පවතින තාක්ෂණික ක්‍රමවේදය සම්බන්ධයෙන් අවධානය යොමු කර නිවැරදිව සොයා බලා සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u>, අලි වැට සම්බන්ධයෙන් වන ගැටළුව සේම විසඳුම සේවීමට යාමේදී අප සිදු කරනු ලබන්නේ, හුදකලා කල එක් ප්‍රදේශයකට වූවත්, අලියා යනු හුදකලා භූමියක සිටින සතෙකු නොවන බවත්, සත්‍ය ලෙසම සිදු කල යුතු වන්නේ අලි මංකඩ විවෘත කිරීම පමණක් බවත්, මීට ඉහතදී අඟල් ඉදි කිරීම සඳහා ඉල්ලීම් කලත් , එයද සාර්ථක ක්‍රමයක් නොවන බවත්, අලි වැට ඉදි කරන්නේ නම් එය කැලය වට කර නොව ගම වට කර ඉදි කල යුතු බවත්, අවම වශයෙන් නෙල්ලිකුලම හා අනෙත් කැළයට මාරුවීම

සඳහා වන කොටසවත් විවෘත කල යුතු ව පවතින බවත්, සිදු වන වගා හානි සඳහා සාධාරණ වන්දියක් ලබා දීමද සිදු කල යුතු වන කාර්යයක් බවද සඳහන් කරමින් ගරු උප සභාපතිතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

තවද වන ජීවි කාර්යාලයේ වන අලින් සම්බන්ධයෙන් මාස්ටර් ප්ලෑන් එකක් පවතින බවත්, ඒ අනුව දීර්ඝ කාලීනව විසඳුමක් ලෙස ක්‍රියාත්මක කිරීම සුදුසු බැවින් ඒ සඳහා කඩිනම් පියවර ගන්නා ලෙසටද ඉල්ලීම් කල යුතු බවත්, ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අදාල වගා හානි සිදු වූ පුද්ගලයන්ගේ නම් ලැයිස්තුවක් ලබා දෙන ලෙසත්, එයද ඇතුලත් කර අදාල තීරණය යොමු කල හැකි බවත්, සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> තේක්ක කැළය ස්තාපිත කිරීමත් සමඟ යටි වගාව විනාශ වී ගිය බවත්, ඒ පරිසරය තුල කිසිදු සත්වයෙකුට වාසය කල හැකි තත්වයක් නොමැති බවත්, එය වහාම නතර කල යුතු බවත්, තේක්ක වගාව ඉවත් කර ස්වාභාවික පරිසරය ඇති කල යුතු බව ප්‍රකාශ කරන ලදී.

තවද අලි මංකඩ විවෘත කිරීම තුල ගම්මාන වල ජනතාවට සිදු වන හානිය වෙනුවෙන් රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස සාධාරණ වන්දි මුදලක් ලබා දිය යුතු බවත්, අලි කියන සතා කිසිසේත්ම කොටු කර තැබිය නොහැකි බවත්, හානි සඳහා ගෙවනු ලබන වන්දි ඉතාමත් ප්‍රමාණවත් නොවන බවත්, ඒ සියල්ල ජාතික වශයෙන් විසඳීම සඳහා කටයුතු සිදු කිරීම සුදුසු බවටත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් වන අලි තර්ජනනය වෙනුවෙන් යෝජනා කල සැළසුම් සම්බන්ධව ලිපියක් වන ජීවී අමාත්‍යවරයා වෙත යොමු කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**13. මහමෙව්නාවේ විනයපාලි මැණියන්ගේ ආවාස ගෙය සඳහා ඇස්බැස්ටෝස් ශීට් ලබා දීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අක්කර 111, අනුලා මාවත, පණ්ඩුලගම ලිපිනයේ මහමෙව්නාව විනයපාලී මැණියන් වහන්සේගේ ආවාස ගෙය ඉතා කුඩා එකක් බවත්, වන්දනා කරන්නට විහාරයක් නොමැති බැවින් පොඩි විහාර ගෙයක් සදා ගැනීමට පටන් ගෙන ඇති බවත්, එහි වහලයට අවශ්‍ය අඩි 06 ක් පමණ දිග ශීට් 06 ක් හා අඩි 08 ක් දිග ශීට් 02 ක් ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති හෙයින් ඒ සඳහා ඉල්ලුම් කර ඇති ශීට් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය</u>, අදාල විහාරගෙයි වහලය ඉදි කිරීම සඳහා අවශ්‍ය ඇස්බැස්ටෝ ශීට් ලබා දීම සුදුස බවට කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරුද්ධත්වයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අක්කර 111, අනුලා මාවත, පණ්ඩුලගම ලිපිනයේ පිහිටි මහමෙව්නාව විනයපාලී මැණියන් වහන්සේගේ ආවාස ගෙයි වහලය සැකසීමට අවශ්‍ය අඩි 06 ක් පමණ දිග ශීට් 06 ක් හා අඩි 08 ක් දිග ශීට් 02 ක් ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**14.** **සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභාවේ සංවර්ධන අංශය විසින් 2020 කියවීමේ මාසය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහනේ ත්‍යාග ප්‍රධාන උත්සවය වෙනුවෙන් සකස් කර ඇති රු 80,500 ක ඇස්තමේන්තුව මහ සභාවට ඉදිරිපත් කරමින් ඉදිරිපත් කල ඇස්තමේන්තුව ප්‍රකාරව සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා සංවර්ධන අංශය මිගින් කියවීමේ මාසය වෙනුවෙන් ක්‍රියාත්මක කල වැඩටහනේ ත්‍යාග ප්‍රධාන උත්සවය, ඉදිරිපත් කල ඇස්තමේන්තුව ප්‍රකාරව සිදු කිරීම සුදුසු බවට වූ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් කියවීමේ මාසය වෙනුවෙන් වූ වැඩසටහනේ ත්‍යාග ප්‍රධාන උත්සවය ඉදිරිපත් කර ඇති රු 80,500.00 ඇස්තමේන්තුව ප්‍රකාරව සිදු කිරීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**15.** **නෙළුබැව මංසන්ධියේ තිබෙන කිරිහල ඉල්ලුම්කරුවෙකු වෙත ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අංක 37, හේනපොලයාගම, හිදෝගම, අනුරාධපුර ලිපිනයේ පදිංචි ජී දේවිකා ප්‍රියදර්ශණී යන අය විසින් දැනට ටෙන්ඩර් මගින් ඉල්ලීම් නොකල නෙළුබැව මංසන්දියේ පිහිටි දියර කිරිහල ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති හෙයින් 2021 වර්ෂය වෙනුවෙන් කත්සේරු මුදල වන රු 21,060.00 මුදලට බදු පදනමින් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා නෙළුබැව මංසන්ධියේ පවතින දියර කිරිහල වාර්ෂික බදු පදනමින් තක්සේරු වටිනාකමට ලබා දීම සුදුසු බවට කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අංක 37, හේනපොලයාගම, හිදෝගම, අනුරාධපුර ලිපිනයේ පදිංචි ජී දේවිකා ප්‍රියදර්ශණී යන අය වෙත දැනට ටෙන්ඩර් මගින් ලබා දී නොමැති නෙළුබැව මංසන්දියේ පිහිටි දියර කිරිහල 2021 වර්ෂය වෙනුවෙන් රු 21060.00 ක මුදලකට බදු පදනමින් ලබා දීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**16.** **බ්ලොග් ගල් මිල දී ගැනීම වෙනුවෙන් ගෙවූ මුදල් බ්ලොග් ගල් ලබා දීමට නොහැකි වීම මත නැවත ගෙවීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා කලත්තැව, කුරුන්දන්කුලම ලිපිනයේ පදිංචි කේ.ජී.ජී සී ගුරුගේ යන අය විසින් 2021.01.19 වන දින 2766 දරණ ලදුපත් අංකයෙන් බ්ලොග් ගල් මිල දී ගැනීම වෙනුවන් රු84000 ක් ගෙවීම් කර ඇතත් එයින් බ්ලොග් ගල් 250 ක් පමණක් ලබා දී ඇති හෙයින ඉතිරි ගල් ලබා දීමට අපොහොසත් වීම හේතුවෙන් ඉතිරි මුදල වන රු 73,500 නැවත ඉල්ලීම් කර ඇති බව සඳහන් කර ආදායම් නැවත ගෙවීමට අදාල එල්.ජී 32 ආකෘති පත්‍ර සහා ගත කරන ලද අතර එම ගාස්තු නැවත ගෙවීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් චාමර මැතිතුමා අදාල කාර්යය ඉටු නොකිරීම ප්‍රාදේශීය සභාවේ අඩුපාඩුවක් වන හෙයින් අදාල මුදල නැවත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අදාල මුදල නැවත ගෙවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**17.** **තණකොළ කපන යන්ත්‍රයක් ලබා ගැනීම.**

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා බල ප්‍රදේශයේ ක්‍රිඩා පිටි තුල තණකොළ කැපීම මේ වන විට සිදු කර ගැනීම ඉතා අසිරු තත්වයේ පවතින බැවින් හා එය නගර සභාවෙන් ලබා ගැනීමද දුෂ්කර බැවින් මෙම ප්‍රාදේශීය සභාව වෙනුවෙන් තණකොළ කපන යන්ත්‍රයක් මිල දී ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා තණකොළ කපන යන්ත්‍රයක් නොමැති වීම ප්‍රාදේශීය සභාවේ විශාල අඩුපාඩුවක්ව පවතින බැවින් කණකොළ කපන යන්ත්‍රයක් මිල දී ගැනීම සුදුසු බවට කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රාදේශීය සභාව සඳහා ට්‍රැක්ටර් රථයට සවි කල හැකි තණකොළ කපන යන්ත්‍රයක් මිල දී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**18.** **බතික් පුහුණුව ලබා දීම.**

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිණිය 2019.03.21 වන දින බතික් පුහුණු වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා රු 26,120.00 වියදම් ඇස්තමේන්තුවක් සභාවට ඉදිරිපත් කර අදාල වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතියක් ලබා ගත් බවත්, තමා විසින් යෝජනා කරන ලද පුහුණු වැඩසටහන තුල ව්‍යාවසායකයෙකු බිහි වන බවත්, එසේ නොවන්නේ නම් පුහුණු වැඩසටහනකින් ඇති ප්‍රයෝජනයක් නොමැති බවත්, සඳහන් කරන ලද අතර එහිදී ඇතිවූ යම් ගැටළුවක් මත අදාල කාර්යය ක්‍රියාත්මක කිරීමට නොහැකි බැවින් 2021 වර්ෂය තුල නැවත එම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා අදාල වැඩසටහන වඩා සුදුසු වැඩසටහනක් බැවින් කඩිනමින් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් බතික් පුහුණු වැඩසටහන සඳහා වන ඇස්තමේන්තුව මුදල් කමිටුව වෙත ඉදිරිපත් කර ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයෙක් ලෙස මේ වන විට වසර 20 ක කාලයක් එක දිගට රැදී සිටිමින් දැක්වූ සහයෝගය හා කැපවීම වෙනුවෙන් තම ස්තූතිය ගෞරවයෙන් පුද කරන බව ප්‍රකාශ කරමින් එතුමා වෙත සමරු තිළිණයක් ගරු සභාවට කැදවා ලබා දීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

තවද කොරෝනා වසංගතය වෙනුවෙන් ප්‍රළාත් පාලන ආයතනයක් ලෙස ආණ්ඩුව ප්‍රාදේශීය සභාව සම්බනක්ධ කර ගනු ලබන්නේ කෙසේද යන්න විමසන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා පළාත් පාලන ආයතන ලෙස සෑම ප්‍රාදේශීය සභාවක් වෙතම අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය විටින් විට ලබා දීමට කටයුතු සිදු කල බවත්, ඊට අමතරව විෂබීජ හරණය වෙනුවෙන්

ඉල්ලීම් කරන අවස්ථා වලදී පොදු ස්ථාන වල හා  රාජ්‍ය ආයතන වල සිදු කරනු ලබන බවත්, කාර්යය මණ්ඩලයේ ජනතාව හා සෘජුවම ගැටෙන සෑම සේවකයෙකු, නිළධාරීයෙකු වෙනුවෙන් පී.සී.ආර් පරීක්ෂණ සිදු කල බවත්, නිරෝධායනයේ යොදා සිටින පුද්ගලයන්ගේ පී.සී.ආර් ලබා ගැනීමටද භූමිය ලබා දී තිබෙන බවත්,UNDP ව්‍යාපෘතිය හරහා  සනීපාරක්ෂක ඇඳුම් ආවරණ ලබා දී තිබෙන බවත්, වරින් වර විෂබීජහරණ දියර ලබා දී තිබෙන බවත්, පසුගිය දින වල එම ව්‍යාපෘතිය හරහා Online සම්බන්ධ විය හැකි උපකරණ, පරිඝණක 02, ඡායා පිටපත් යන්ත්‍රයක්, ලැප්ටොප් යන්ත්‍රයක්, ආදී උපකරණ රාශියක් ලබා දී තිබෙන බවත්, ඉදිරියේදී එවැනිම වූ උපකාර සිදු කිරීමට සූදානමින් සිටින බවත්, සඳහන් කරන ලදී.

තවද කොරෝනා සම්බන්ධයෙන් වන කමිටු රැස්වීම සඳහා කැදවීම් සිදු කරන බවත්, ඒ සඳහා සහභාගී වන බවත්, සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u> අළුත්වැව පෙර පාසල මේ වන විට බෝධිරුක්කාරාම විහාරස්ථානයට ගෙන ගොස් ඇති බවත්, මීට ඉහතදී පන්සලේ ද පෙර පාසලක් තිබුණු බවත්, එයද වෙනත් ස්ථානයකට මාරු කල බවත්, මෙම පෙර පාසල් සඳහා විවිධ කාල පරාසයන් තුල විවිධ අරමුදල් හරහා විවිධ සංවර්ධන කාර්යයන් සිදු කල නමුත් එකිනෙකාගේ අවශ්‍යතාවන් මත ඒ ඒ අයුරින් හිතුමනාපයට කටයුතු කිරීම තුල අපතේ යන මුදල් සම්බන්ධයෙන් අපරාධයක් වන බැවින් එලෙස පෙර පාසල් සම්බන්ධයෙන් ඒ ඒ පුද්ගලයන්ට අවශය පරිදි කටයුතු කිරීමේ හැකියාව පවතින්නේද යන්න විමසන ලද අතර සභාවක් ලෙස පොදු ප්‍රතිපත්තියක් සකස් කල යුතු වන බව ප්‍රකාශ කරන ලදී.

තවද ප්‍රභූවරුන්ගේ ඡායාරූප මාර්ග වල ප්‍රදර්ශණයට තබා ඇති හෙයින් ඒවා ඉවත් කල යතු බවට ලිපියක් යොමු කර තිබෙන බැවින් එය සත්‍ය ලෙසටම ක්‍රියාත්මක කරනවාද යන්න සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> අදාල පෙර පාසල කිසිදු අවසරයක් නොමැතිව පන්සල වෙත රැගෙන ගිය බවත්, වසර 30 අදාල ස්ථානයේ පවත්වාගෙන ගිය බවත්, වහලයේ ශීට් කැඩී අබලන් තත්වයේ පැවති බැවින් එලෙස පන්සල වෙත රැගෙන ගිය බැවින් පූර්ව ළමා විය සංවර්ධන අධිකාරිය වෙත දැනුවත් කර නැවත අදාල ස්ථානය වෙත ස්ථාපිත කරන්නේනම් අදාල අළුත්වැඩියාවන් සිදු කිරීමේ හැකිවයාව සභාව සතුව පවතින බවට සඳහන් කර ලිපියක් යොමු කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> පෙර පාසල් සම්බන්ධව වෙනම අධිකාරීයක් පවතින බැවින්, අදාල ප්‍රතිපාදන සම්බන්ධයෙන් හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තීන්දු තිරණ ගන්නා බවත්, ඒ සම්බන්ධයෙන් වන ගැටළු ඔවුන් සමඟ සාකච්ඡා කල යුතු බව සඳහන් කරන ලදී.

තවද මාර්ග වල ප්‍රභූ පින්තූර ප්‍රදර්ශණය නොකිරීම ප්‍රායෝගික සිදු නොකරන බවත්, ප්‍රාදේශීය සභාව විසින් අදාල කාර්යය සිදු නොකරන මුත් , රේඛීය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති වලදී පමණක් අදාල කාර්යය සිදු කරනු ලබන බවත්, සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> අදාල කරුණ සඳහන් කර මේ සම්බන්ධ ලිපියක් යොමු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**ඊ) කාරක සභාවල වාර්තා**

**2021 ජනවාරි මස 13 වන දින මුදල් කමිටු වාර්ථාව**
**2021 ජනවාරි මස 11 වන දින සැළසුම් උපදේශක කමිටු වාර්ථාව**

සභා ගත කිරීම සිදු කරන ලදී.

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2020 දෙසැම්බර් මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

**නැත.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා බල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් සහයෝගය දැක්වූ හා වටිනා අදහස් ලබා දුන් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2020.01.25 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 12.36 ට අවසන් කරන ලදී.

| | |
|---|---|
| ..................................... | ........................................... |
| යූ.ඒ ධම්මික, | එස්.බී කුමාරදාස, |
| ලේකම්, | සභාපති , |
| නැ.නු.ප ප්‍රාදේශීය සභාව, | නැ.නු.ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |